
# 4 ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ වර්ධනය හා එහි පරිහානිය

**ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ ආරම්භයත්, වාරි තාක්ෂණය, පාලන සංවිධානය, ආර්ථික රටාව, විදේශ සම්බන්ධතා, ආගම හා සංස්කෘතිය වැනි අංශවල වර්ධනයේ ස්වභාවයත්, ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ පරිහානියත් පිළිබඳ තොරතුරු සපයා ගැනීමට මෙම ඒකකය අධ්‍යයනය කරමු.**

ජලය පදනම් කොටගෙන ආරම්භ වී වර්ධනය වූ නිසා මෙම ශිෂ්ටාචාරය ජලාශ්‍රිත ශිෂ්ටාචාරය නමින් හැඳින්වෙයි. මෙම ශිෂ්ටාචාරය ආරම්භ වී ඇත්තේ ක්‍රි.පූ. 6වන සියවසේ දී උතුරු ඉන්දියාවෙන් පැමිණි ආර්යයන්ගෙන් බව අපි දනිමු. මොවුහු ගංගා ආශ්‍රිත ව සිය ජනාවාස පිහිටුවාගෙන ඒවායෙහි ජලය, ගොවිතැන් කටයුතු සඳහා යොදා ගනිමින් ජීවත් වූහ. කල් යත් ම ගොවිතැන් කටයුතු සඳහා ජලය එක්රැස් කර තබා ගැනීම අවශ්‍ය විය. මේ අනුව වාරිමාර්ග ඉදිකිරීමට ඔවුහු පෙළඹුනහ.

**වාරිමාර්ග ක්‍රම අවශ්‍ය වීමට හේතු :**

- ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වී වගාව වීම.
- ගංගා ජලය වී වගා කටයුතු සඳහා ප්‍රමාණවත් නොවීම.
- වර්ෂාව අවුරුද්දේ එක් කාලයකට සීමා වීම.
- වර්ෂාපතනය ප්‍රමාණවත් නොවීම.
- ජන සංඛ්‍යාව අධික වීම නිසා වගාබිම් පුළුල් වීම.




**වාරිමාර්ග පද්ධතිය ආරම්භයට බලපෑ භෞතික සාධක**

- වියළි කලාපයේ යෝග්‍ය භූ විෂමතා ලක්ෂණ තිබීම.
    - හෙල්වැටිවල විහිදීම
    - හෙල්වැටි අතරින් ගලා බසින ගංගා තිබීම
- වියළි කලාපීය තැනිතලාවේ බෑවුම අනුව ඇළවල් කැපීම සඳහා යෝග්‍ය භූ විෂමතාවක් තිබීම.
- ගංගාවන් දඟර ගැසෙමින් වක්කලමක හැඩයට ගලා බැසීම නිසා ජල පහරේ වේගය අඩුවන ස්ථාන තිබීම.
  (මේ නිසා අමුණු ඉදිකළ හැකිවීම)
- මිටි කඳුවැටි හා ඒවායේ නෙරු පිහිටා තිබීම. (වේළි බැඳීම පහසුවීම)

| වාරිමාර්ග ආරම්භය හා වර්ධනය | | |
|---|---|---|
| වාරිමාර්ග ඉදිකිරීම සඳහා මූලිකත්වය | වාරිමාර්ග | වර්ධනයේ ස්වභාවය |
| ගම් ප්‍රධානීන් (පරුමක) | කුඩා වැව් ඉදිකිරීම (ගම් වැව්) | ගමේ පවුල් කිහිපයක් පමණක් ගොවිතැන් කටයුතු සඳහා යොදා ගැනීම |
| පණ්ඩුකාභය රජතුමා | අභය වැව, ජය වැව, ගාමිණී වැව | රාජ්‍ය අනුග්‍රහය ලැබීම, හඳුනාගෙන ඇති පැරණි ම වැව අභය වැව වීම |
| දේවානම්පියතිස්ස රජතුමා | තිසා වැව | රාජ්‍ය අනුග්‍රහය ලැබීම |
| සද්ධාතිස්ස රජතුමා | වැව් 18ක් කළ බව වංශකථාවල සඳහන් වීම. | - |
| වසභ රජතුමා | වැව් 11ක් හා ඇළවල් 12ක් ඉදිකිරීම, නිදඃ මහවිලච්චිය, මනාකැටිය වැනි වැව් හා ඇළහැර ඇළ | විශාල වැව් ඉදිකිරීම ආරම්භවීම, උමං ජල මාර්ග තැනීම, ඇළ මගින් වැව්වලට ජලය ලබාදීම |
| මහසෙන් රජතුමා | වැව් 16ක් ඉදිකිරීම හා ඇළහැර ඇළ විශාල කිරීම, මින්නේරිය, හුරුළු මහකනදරා වැනි වැව්. | ඇළහැර, මින්නේරි, කවුඩුලු, ඒකාබද්ධ වාරිමාර්ග පද්ධතිය ඉදිකිරීම |
| ධාතුසේන රජතුමා | වැව් 18ක් හා ඇළක් කරවූ බව කලාවැව, මාදතුගම, මැද්දේකැටිය වැව ආදිය, යෝධ ඇළ | යෝධ ඇළ මගින් අනුරාධපුරය ආසන්න වැව්වලට ජලය ගෙනයාම වැව් කිහිපයක් එකතු කර විශාල වැව් ඉදිකිරීම (කලාවැව) යෝධ ඇළ - විශිෂ්ට නිර්මාණයකි |
| දෙවන මුගලන් රජතුමා | පදවිය වැව හා පත්පහන් වැව (නාච්චදූව වැව) | විශාල වැව් ඉදිකිරීම |
| පළමුවන අග්බෝ රජතුමා | සිරිවඩ්ඩමානක වැව, කුරුඳු වැව, ආදිය මිනිපේ වේල්ල හා ඇළ | වාරි කර්මාන්තයේ විශිෂ්ට නිර්මාණයක් ලෙස මිනිපේ වේල්ල හා මිනිපේ ඇළ නිර්මාණය සැලකේ |
| දෙවන අග්බෝ රජතුමා | කන්තලේ, ගිරිතලේ වැව් ඉදිකිරීම. | කන්තලේ වැව විශාල ජලාශයක් ලෙස ඉදිකිරීම |
| පළමුවන විජයබාහු රජතුමා | ඇළහැර වැව, මහගල්කඩවල වැව, මහකනදරා වැව, පත්පහන් වැව, ආදිය ප්‍රතිසංස්කරණය කිරීම | අනුරාධපුර යුගය අවසානයේ නටඹුන් වී ගිය වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීම |
| පළමුවන පරාක්‍රමබාහු රජතුමා | රජවීමට පෙර දැදුරු ඔය හරස්කර වේලි ඉදිකිරීම, පඬා වැව විශාල කිරීම රජවීමෙන් පසු පරාක්‍රම සමුද්‍රය හා අංගමැඩිල්ල ඇළ වැනි වාරි නිර්මාණ ඉදිකිරීම. | වැව් කිහිපයක් එකතු කර විශාල වැව් ඉදිකිරීම අනුරාධපුර පොළොන්නරු යුගවල වර්ධනය වූ වාරි කර්මාන්තය උච්චතම අවස්ථාවට දියුණුවීම. වාරි කර්මාන්ත ඉතිහාසයේ ස්වර්ණමය යුගය ලෙස සැලකීම |
| නිශ්ශංකමල්ල රජතුමා | නිශ්ශංක සමුද්‍රය නමින් වැවක් ඉදිකළ බව සඳහන් වේ. | |

ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ වාරි කර්මාන්ත

## ක්‍රියාකාරකම්

✍ අනුරාධපුර යුගයේ හා පොළොන්නරු යුගයේ ඉදිකළ වැව්, ඇළ, අමුණු හා වේලි පිළිබඳ ලේඛනයක් සකස් කරන්න.
✍ ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ වාරි - කර්මාන්ත දැක්වෙන සිතියමක් අඳින්න.

### වැව් හා ඇළ මාර්ග පද්ධතිය


ගලා යන ඔයක්, ගඟක් හෝ දිය පාරක් හරස් කර වැව් නිර්මාණය කර ඇත. වැවේ ඍජු පෝෂක ප්‍රදේශයට අමතර ව බාහිර ප්‍රභවයන්ගෙන් ජලය ලබාගන්නා අවස්ථා ද දක්නට ලැබේ. වැව් නිම්නයේ වැවට සමීප ඔයකින් හෝ ගඟකින් ජලය ලබාගෙන ඇත.

මෙවැනි අවස්ථා රැසක් පැරණි වාරි කර්මාන්තය ආශ්‍රිතව දක්නට ඇත.

**මාගල්ල වැවට** - දැදුරු ඔයෙන් රිදී බැඳි ඇළ ඔස්සේ ජලය ලබා ගැනීම.

**තබ්බෝව වැවට** - මී ඔයෙන් ජලය ලබා ගැනීම.

**පරාක්‍රම සමුද්‍රයට** - අඹන් ගඟෙන් ජලය ලබාගැනීම.





සිතියම 4.1 - රජරට පැරණි වාරි කර්මාන්ත

ගඟේ හෝ ඔයේ උචිත ස්ථානවල දී මිටි බැම් බැඳ එහි ජලය බැසයාමට සලස්වා, එමගින් ඇළමාර්ග ඔස්සේ ජලය ගෙනයාම තව ක්‍රමයකි.

උදා : ❑ අංග මැඩිල්ලේ දී අඹන් ගඟෙන් පරාක්‍රම සමුද්‍රයට ජලය ගෙන යාම.

❑ ඇළහැර දී අඹන් ගඟ හරස්කොට ඇළහැර ඇළට ජලය ගෙන යාම

❑ මහවැලි ගඟෙන් මිනිපේ ඇළට ජලය ගෙනයාම




රූපය 4.1 - වැවක ප්‍රධාන අංග

මව් වැව රොන් මඩින් මුදවාලීම සඳහා කුළු වැව් ඉදිකර ඒ හා සම්බන්ධ ඇළමාර්ග පද්ධතියක් ඉදිකිරීම පැරණි වාරි කර්මාන්තයේ තවත් ලක්ෂණයකි. ඇළ මාර්ග තැනීමේ දී කුළු වැව් හරහා ජලය ගලා යාමට සැලැස්වීම මෙහි විශේෂත්වයකි. මෙමගින් මහ වැවට රොන් මඩ එකතු වීම වළකියි.


නිදා : ඇළහැර ඇළ මගින් මින්නේරිය ගිරිතලේ වැව්වලට ජලය සැපයීමේ දී කුළුවැව් හරහා ඇළමාර්ග ඉදිකිරීම.

❑ වැවකින් තවත් වැව් පෝෂණය සඳහා ජලය ගෙනයාමට ඇළමාර්ග තනා ඇත. නිදා : කලා වැවේ සිට යෝධ ඇළ මගින් තිසා වැවට ජලය ගෙනයාම.

❑ වැව යටතේ අස්වැද්දිය හැකි කුඹුරුවලට පහසුවෙන් ජලය සැපයීම සඳහා ද ඇළමාර්ග ඉදිකර ඇත. මෙහි දී වැවෙන් පිටකරන ජලය ඇළමාර්ග ඔස්සේ කෙත්බිම්වලට යවන අතර කෙත් බිම්වලින් නිකුත් කරන ජලය (වෙල් පහු වතුර) නැවත, ජලය, බෙදහරින ඇළ මාර්ගවලට ම ඇතුළුවන ආකාරයෙන් ඇළමාර්ග සකස් කර ඇත. මේ සියලු ම ඇලවල් භූමියේ උස් පහත්කම් අනුව එයට සුසංගත ව සකස් කර තිබිණි.

## වාරි තාක්ෂණය

### වැව් බැම්ම




රූපය 4.2
වැව්බැම්ම - ක්වාට්සයිට් පාෂාණය මත විහිදීම.

වැවක් ඉදිකිරීමේ දී වැව් බැම්මේ නිර්මාණය ඉතා වැදගත් ය. ගලා යන ජලපාරක් හරස් කර බැම්මක් බැඳීමේ දී එකිනෙකට ළං ව පිහිටි කඳු ගැට දෙකක් සම්බන්ධ කර ගත් බව දක්නට ඇත. ජලය රැස්වන උස්බිමේ පාෂාණ සංයුතිය පිළිබඳ ව ද සොයා බලා ඇත.

උදා : මින්නේරිය වැවේ වැව් බැම්ම ස්ථානගත කර ඇත්තේ පොළොවේ ක්වාට්සයිට් පාෂාණ විහිදීම මත ය.


පාෂාණ ස්තරවල ආනතිය වැව ඇතුළට නැමී පවතින අවස්ථාවක් තෝරා ගැනීම වැව් බැම්ම නිර්මාණයේ දී සැලකිලිමත් වූ තවත් අවස්ථාවකි. මෙ මගින් ජලය කාන්දුවීම වැළකේ.

සමෝච්ච රේඛා විහිදීම මත වැව් බැමි නිර්මාණය කර ඇත.

නිද : පරාක්‍රම සමුද්‍රයේ බැම්ම

කඳු රහිත ප්‍රදේශවල භූමියේ පිහිටීම අනුව වැව් තනා තිබීම.

නිද : මන්නාරම් දිස්ත්‍රික්කයේ යෝධ වැවේ බැම්ම සැතපුම් 7ක් පමණ දිග චාපයක් ලෙස නිර්මාණය කර ඇත.



රූපය 4.3 - පාෂාණ ස්ථරවල ආනතිය

## සළපනාව

වැව් බැම්මේ ආරක්ෂාව සඳහා වැව් බැම්මේ ඇතුළු පැත්තේ පාදමේ සිට ඉහළ ජල මට්ටම දක්වා කළුගල් පුවරු අතුරා ඇත. මෙය සළපනාව, රළ පැන්නුම, රළපනාව ලෙස හැඳින්වේ. මේ නිසා වැව් බැම්ම රළ පහරින් සේදීයාම වළකියි.

## සොරොව්ව

වැවේ රැඳවූ ජලය කෙත්බිම් කරා ගෙනයාම පිණිස ඇළට ජලය මුදා හැරීම සඳහා සකස් කළ නිර්මාණයකි. පැරණි වැව්වල ඉතාමත් සියුම් ව ජලය කාන්දු නොවන ආකාරයෙන් කළුගලෙන් සොරොව් නිමකර ඇත.

ඇළ හැරීම වැළැක්වීම සඳහා සොරොව්වේ වැව පැත්තේ සිදුර කුඩාවටත් ඇළ හා සම්බන්ධවන පිටත විවරය විශාලවටත් සකස් කර ඇත.

ගොඩ සොරොව්ව හා මඩ සොරොව්ව යනුවෙන් සොරොව් වර්ග දෙකකි. වැවේ ජල මට්ටම ඉහළ තිබෙන විට ජලය සැපයිය හැකි අයුරින් ඉහළ ජල මට්ටමේ පිහිටි සොරොව්ව ගොඩ සොරොව්ව ලෙස හැඳින්වේ. වැව් බැම්මේ පහළ මට්ටමින් මඩ සොරොව්ව පිහිටුවා ඇත. මඩ ඉවත් කිරීම සහ ජල මට්ටම පහළ ගිය අවස්ථාවල දී ජලය බෙදාහැරීම සඳහා මඩ සොරොව් යොදා ගැනේ.



රූපය 4.4 - සොරොව්ව

## බිසෝ කොටුව.

විශාල වැවක වැව් බැම්ම හරහා සොරොව්වකින් ජලය පිටට යැවීමේ දී වැව් බැම්මට වන හානිය වැළැක්වීම සඳහා බිසෝකොටුව නිර්මාණය කර ඇත. හතරැස් ළිඳක හැඩයට තනා ඇති බිසෝකොටුව මෙරට වාරි කර්මාන්තයේ විශිෂ්ටතම නිර්මාණයකි. අවශ්‍ය වේලාවට හා අවශ්‍ය ප්‍රමාණයට ජලය නිකුත් කිරීම සඳහා යොදා ගන්නා විශේෂ ජල පාලන උපකරණයක් බිසෝ කොටුවෙහි ඇත. මෙය "මොහොල" නමින් හැඳින්වේ. කළුගල් ඉතා සියුම් මටසිලිටු ආකාරයෙන් සකස් කර ජලය කාන්දු නොවන ලෙස මෙම නිර්මාණය ඉදිකර ඇත.



රූපය 4.5 - බිසෝ කොටුව

## පිටවාන

වැවේ අතිරික්ත ජලය පිටකිරීම සඳහා ඉතා ශක්තිමත් ව සකස් කළ නිර්මාණයකි. බොහෝ විට වැව් බැම්මේ කෙළවරක වැව් බැම්මේ මට්ටමට පහත්වන සේ ගල් පුවරු යොදා සකස් කර ඇත. අතිරික්ත ජලය පිටවාන ඔස්සේ බැස යාම නිසා වැව් බැම්ම ආරක්ෂා වේ. පිටවානෙන් නිකුත්වන ජලය කෙත් බිම්වලට හානි නොකර ඇළමාර්ග ඔස්සේ ස්වභාවික දිය බස්නාවකට හෝ වෙනත් වැවකට ඇතුළු වන සේ සකස් කර ඇත.

## ඇතුළුවාන

බාහිර ජල සැපයුමක් මගින් වැවකට ජලය සපයන විට එම ඇළ වැවට විවෘත කරනු ලබන්නේ ඇතුළුවාන මගිනි. මෙය පිටවාන මෙන් වඩා ශක්තිමත් නිර්මාණයක් නො වේ. ජලමාර්ග දිගේ ගලා එන රොන්මඩ වැවට යා නොදී රඳවා ගැනීම ඇතුළුවාන මගින් සිදු වේ. බාහිර ජල සැපයුම් නවතා දමා ඇතුළුවානට පිටින් ගොඩ ගැසෙන රොන්මඩ ඉවත් කළ හැකි ය.

## ඉස්වැටි

වැව ඉස්මත්තේ දළ බැවුම් සහිත කඳු හා උස්බිම් පාමුල දිගේ අඩි 2ක් හෝ 3ක් උසට පස්වලින් වැටි සකස් කර ඇත. මේවා ඉස්වැටි නැතහොත් පෝටා වැටි නමින් හැඳින්වෙයි. මේ මගින් බැවුම් දිගේ ගලා එන රොන්මඩ වැවට ඒම වැළැක්මත්, උස්බිම් පාමුල තෙතමනය ආරක්ෂාවීම නිසා ශාක වර්ධනයට යෝග්‍ය පරිසරයක් සකස්වීමත් සිදු වේ.

## කළිඟුබැමි

වැවක පිටවානට පෙර වැව ඇතුළතින් වැව් බැම්මට ලම්බක ව වැව හරහා යොද ඇති නොඋස් බැමි කළිඟුබැමි ලෙස හැඳින්වෙයි. පිටවානේ මට්ටමට වඩා මෙය පහත් ය. මෙය වැවේ ජලය පිරුණු අවස්ථාවල ජලයට යට වී පවතී. කළිඟුබැමි ඉදිකර ඇත්තේ පිටවාන දුර්වල වී කැඩීගියහොත් වැවේ ජලය මුළුමනින් ම බැසයාම වළක්වා ගැනීමට ය. මෙවැනි බැම්මක් පරාක්‍රම සමුද්‍රයේ ඇත.

## තාවුල්ල

වැවේ උපරිම ජල මට්ටම සලකුණු කරන වැව වටා ඇති ප්‍රදේශය තාවුල්ල ලෙස හැඳින්වෙයි. මෙම ප්‍රදේශය පුරා සිසිල් ගුණයෙන් යුත් ශාක පැතිරී ඇත. නොයෙක් තෘණ වර්ග හා කුඹුක්, තිඹිරි, මී වැනි ශාක ද දක්නට ඇත. වැව් තාවුල්ලේ සත්ත්ව රංචු දක්නට ලැබේ.



රූපය 4.6 - කුළු වැව

## කුළුවැව්

කඳු බැවුම් ඔස්සේ ඇද හැලෙන කුඩා දියපාරවල් පටු බැම්මක් යොද හරස් කර ඇත. මේ නිසා කුඩා වැව් නිර්මාණය වේ. මෙම වැව්වලට සොරොව් නොමැත. ගල් යොදා සකස්කළ පැන්නුමකින් මහ වැව වෙත ජලය නිකුත් වේ. කුළුවැවට රොන්මඩ එකතුවීම නිසා මහවැවට රොන්මඩ එකතුවීම වළකියි. මහවැවට අතිරික්ත වර්ෂා ජලය ගලා ඒම වැළකීම ද කුළුවැව් නිසා සිදුවේ. ජලය රඳවා තබා ගැනීම නිසා වැව ඉහත්තාවේ ශාක වර්ධනය හොඳින් සිදුවන අතර උල්පත් ජලය ද වැඩි වේ. මව්වැවට ජලය හිඟ වූ විට කුළුවැවෙන් ජලය සැපයීම ද සිදු වේ.

### ඇළමාර්ග හා බැඳුණු තාක්ෂණය

- ඇළ මාර්ගයක් වැඩි බෑවුම් ප්‍රදේශයක් හරහා ගලා යන විට වේගය පාලනය කිරීම සඳහා ගලින් තනන ලද අත්තිවාරම් හා කුඩා ගල් කණු ඇළවේල්ලේ ඇතුළු පැත්තේ තැනින් තැන සවි කිරීම
  උදා : ඇළහැර අමුණේ සිට මින්නේරිය වැවට ජලය සපයන ඇළහැර ඇළ මාර්ගය
- ඇළමාර්ග ජලයෙන් පිරුණ විට අතිරික්ත ජලය පිට කිරීම සඳහා කළුගලින් නිමකළ වාන් සකස් කිරීම
- භූමියේ හැඩ තල අවබෝධ කරගෙන දිගු ඇළ මාර්ග සකස් කිරීම
- උමං ජල තාක්ෂණය - නළ මගින් වැව්, පොකුණුවලට ජලය සැපයීම
  නිද : තිසා වැවේ ජලය රන්මසු උයනට හා කුට්ටම් පොකුණ ආදී ස්ථානවලට ගෙනයාම
- ඇළ මාර්ග නිර්මාණය කිරීමේ දී සුළු බෑස්මක් ඔස්සේ විශාල දුරකට ජලය ගෙනයාම
  උදා : කලාවැවේ සිට යෝධ ඇළ දිගේ කිලෝ මීටරයට මිලි මීටර් 95 බෑස්මක් යටතේ ජලය ගෙනයාම
- වාරිමාර්ග තැනීමේ දී හූ පිහිටීම මෙන් ම ජලය උරා ගැනීම, ඇළ වේලි ශක්තිමත් ව පවත්වා ගැනීම. ජල ගැලීමක දී හෝ පෘථිවි බාදන අවස්ථාවන්ට ඔරොත්තු දෙන පරිදි තැනීම ආදිය පිළිබඳ සැලකිලිමත් වී තිබීම
- සමස්ත වියළි කලාපය ම ආවරණය වන ආකාරයෙන් වාරි පද්ධතියක් සැකසීමට යෝග්‍ය පරිදි ඇළවල් නිර්මාණය කිරීම
- ජල දහරාවක් දඟර ගැසෙමින් ගලා බසින විට වේගය අඩුවන බව දැනගත් වාරි ශිල්පීන් ඒ හරහා බාධකයක් ඉදිකොට ඉන් ඉහළට එසවන ජලය ඇළ මගින් පහත් ප්‍රදේශවලට ගෙනයාම

**ක්‍රියාකාරකම**

✍ **වැව් හා ඇළමාර්ග ආශ්‍රිත තාක්ෂණික අංග ඇතුළත් කරමින් වැවක ආකෘතියක් නිර්මාණය කරන්න.**

## පාලන සංවිධානය

**ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ පාලන සංවිධානය**

- **මධ්‍ය පාලනය**
- **ප්‍රාදේශීය පාලනය**
- **ගම් පාලනය**

### මධ්‍ය පාලනය

මෙහි ප්‍රධානියා රජතුමා ය. රාජ්‍යත්වය ලබා ගැනීම සඳහා අභිෂේක උත්සවයක් පැවැත්විය යුතු ය. රජ තම වංශයට ගැළපෙන බිසොවක් ද තෝරාගෙන රටවැසියා ඉදිරියේ මෙම අභිෂේක උත්සව පවත්වා ඇත. මෞර්ය සම්ප්‍රදය අනුව අභිෂේක උත්සව පැවැත්වීම දේවානම්පිය තිස්ස රජතුමාගෙන් ආරම්භ වී ය. රජතුමා විසින් රටවැසියාට ඉටුකළ යුතු කාර්ය රැසක් ගැන මූලාශ්‍රවල සඳහන් වේ.

- ✪ රටවැසියන් ආරක්ෂා කිරීම.
- ✪ ගොවිතැන් කටයුතු සඳහා වාරි කර්මාන්තය පහසුකම් සලසා දීම.
- ✪ ආගමික හා සංස්කෘතික කටයුතු දියුණු කිරීම.

රජතුමා පාලන කටයුතු කිරීමේ දී මහා සංඝයා වහන්සේලාගේ මෙන් ම පුරෝහිත, සේනාපති සහ ඇමති වැනි ප්‍රභූන්ගේ උපදෙස් ලබාගෙන ඇත. බුදු දහමට අනුව දසරාජ ධර්මය සැලකිල්ලට ගෙන පාලන කටයුතු මෙහෙයවීම රජතුමාගේ කාර්යයක් විය.

අනුරාධපුර යුගයේ දී ඇතැම් අවස්ථාවල රජතුමා බෝසත් කෙනෙක් ලෙස පිළිගැනුනු අතර පොළොන්නරු යුගය වන විට මිනිස් වෙසින් සිටින දෙවි කෙනෙකු ලෙස රජතුමා හැඳින්වීමට උත්සාහ ගෙන ඇති අවස්ථා ද පවතී.

රජකම උරුම වූයේ සහෝදරයාගෙන් සහෝදරයාට හෝ පියාගෙන් පුතාට ය. බාල ම සහෝදරයාගෙන් පසු වැඩිමහල් සහෝදරයාගේ පුතාට රජකම හිමිවිය. රජතුමා රජරට ප්‍රාදේශීය පාලන මධ්‍යස්ථානය කරගෙන සිටි අතර යුවරජු (මාපා) මායා රටේ (දක්ෂිණ දේශයේ) පාලන කටයුතු මෙහෙයවීය. ඇපා තනතුර හිමිවූයේ රුහුණේ පාලකයාට ය. රජතුමා මිය ගිය පසු දක්ෂිණ දේශයේ පාලකයා වූ මාපා රජකමට පත් විය. රෝහණයේ සිටි ඇපා, මාපා තනතුරට පත්වීය. නිත්‍යානුකූල ව අභිෂේක ලත් බිසවගේ පුතුන්ට පමණක් රජකම උරුම විය.

### රාජ්‍ය නිලධාරීහු

රජුට සහාය සඳහා නිලධාරීහූ රැසක් වූහ. මෙහි දී වැදගත් ම තනතුර වූයේ සේනාපති ය. මේ සඳහා රජුගේ ළඟ ම ඥාතියෙක් පත් කර ගත් අතර ඔහුට සහාය සඳහා සෙන්පතිවරුන් පත් කර ඇත. ඡත්තගගාහක, අසිග්ගාහක, අමාත්‍ය, පුරෝහිත, බඩගරික, මහලේනා, වෙදනා වැනි නිලතල රාශියක් විය. මේ සියලු දෙනා ම එකතු වී රාජසභා පවත්වා පාලන කටයුතු පිළිබඳ සාකච්ඡා කර ඇත. පසු කාලයේ දී වේලයික්කාර හමුදවක් ද වීය. එනම් කුලී හමුදවයි.

**ක්‍රියාකාරකම**

**ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ පාලනය සඳහා වූ නිලධාරීන්ගේ තනතුරු ඇතුළත් ලේඛනයක් සකස් කරන්න**

### ප්‍රාදේශීය පාලනය

මධ්‍ය පාලනය හැරුණු විට රජුගේ පාලන කටයුතුවල සහායට ප්‍රාදේශීය පාලන ඒකක පහත සඳහන් පරිදි සැකසී තිබිණි.


- ✪ උත්තරපස්ස (උතුරු)
- ✪ පාචීනපස්ස (නැගෙනහිර)
- ✪ දක්ඛිණපස්ස (දකුණු)
- ✪ පශ්චිමපස්ස (බටහිර)

අනුරාධපුර යුගයේ අග භාගය වන විට රජරට, රුහුණු රට, මලය රට හා දක්ඛිණ දේශය යනුවෙන් පාලන ඒකක කීපයක් පැවතිණි. ලංකාවේ දකුණු හා නැගෙනහිර කොටස් රුහුණු රටට අයත් විය.

පොළොන්නරු යුගය වන විට

- ✪ රජරට, දක්ඛිණ දේශය, දෙළොස් දහස් රට, අට දහස් රට යනුවෙන් කොටස් 4කට බෙදී පැවතිණි.

මුල් කාලයේ යාපන අර්ධද්වීපය නකදිව හෙවත් නාගදීප නමින් හඳුන්වා ඇත. වසභ රජුගේ කාලයේ ඉසිගිරි නම් ඇමතියෙකු උතුරු ප්‍රදේශයේ ප්‍රාදේශීය පාලකයා ලෙස කටයුතු කළ බව සඳහන් වේ.




**සිතියම 4.2 - ප්‍රාදේශීය පාලනය**

## ගම් පාලනය

පණ්ඩුකාභය රජතුමාගේ සිට පොළොන්නරු යුගයේ අවසානය දක්වා ම ගම් පාලනය විධිමත් ව පැවති බවට මූලාශ්‍රවලින් තොරතුරු ලැබේ. පණ්ඩුකාභය රජතුමා ලංකාව පුරා ම ග්‍රාම සීමා ලකුණු කළ බව වංසකථාවල සඳහන් වේ. පාලන සංවිධානයේ වැදගත් ම මෙන් ම කුඩා ම පාලන ඒකකය වූයේ ගම ය. ගමේ සාමය හා විනය පවත්වා ගැනීම සඳහා ගම් සභාව නමින් සංවිධානයක් වී ය. මෙහි ප්‍රධානියා ගමික, පරුමක, ග්‍රාමභෝජක යන නම්වලින් හැඳින්විණි.

### ගමික සතු කාර්යය

- ✪ ගමේ සාමය හා විනය පවත්වා ගැනීම
- ✪ ගැමියන්ගේ සිරිත් විරිත් හා සම්ප්‍රදායන්ට අනුව කටයුතු කිරීම
- ✪ ගමේ ආදායම් එකතු කිරීම
- ✪ ගම්වාසීන් සමග සාමූහිකව කටයුතු කිරීම
- ✪ ගමේ කටයුතු ගැන රජතුමාට වගකීමට බැඳී සිටීම
- ✪ යුක්තිය පසිඳලීම

ග්‍රාම පාලනයේ දී ප්‍රජාතාන්ත්‍රික ලක්ෂණ කැපී පෙනෙයි. විවිධ සේවාවන්හි නියුක්ත වූවන්ට ගම්බිම් ලබාදීම රජතුමා විසින් කරන ලදී. අපරාධකරුවන් ගමකට වැද සැඟවුනොත් ඔවුන් අල්ලා දිය යුතු විය. ආරාමවලට ගම්බිම් පූජා කිරීම ද සිදු විය.

**ක්‍රියාකාරකම**

**ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ පාලන කටයුතු විමධ්‍යගත කිරීම රජතුමාගේ පාලනය පහසු කරන්නක් වීය. මේ පිළිබඳ ව සමාජ විද්‍යා සංගමයේ කතාවක් පැවැත්වීම සඳහා අවශ්‍ය තොරතුරු වාර්තා කරන්න.**

## ආර්ථික රටාව

අනුරාධපුර යුගයේ ආරම්භයේ සිට මුළු ජලාශ්‍රිත ශිෂ්ටාචාරය පුරා ම ක්‍රමයෙන් වර්ධනය වී ශීඝ්‍ර දියුණුවක් ඇති වූ වාරි කර්මාන්තය, ආර්ථික රටාව හැඩ ගැසීමට මනා පිටුබලයක් වි ය. මේ අනුව ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ ආර්ථිකයේ මූලික පදනම කෘෂිකර්මාන්තය වි ය. කෘෂිකාර්මික කටයුතුවල දී වී වගාව ප්‍රධාන වී ය. එකල ද සිංහලයාගේ ප්‍රධාන ආහාරය, “බත” වූ බැවින් සහල් ලබා ගැනීම සඳහා වසරකට කන්න දෙකක් හෝ තුනක් වී වගා කළහ. සිරිමේඝවර්ණ රජුගේ කාලයට අයත් තෝනිගල සෙල්ලිපියේ “පිටදඩහස”, “මදෙහස” හා “අකල හස” යනුවෙන් කන්න තුනක් වගා කළ බව සඳහන් වීමෙන් ඉහත කරුණු සනාථ වේ. අවුරුද්ද පුරා ම වැව් මගින් ජලසම්පාදනය කළ හැකි වූ ප්‍රදේශවල පමණක් කන්න තුන ම වී වගා කරන ලදී. ජලාශ්‍රිත ශිෂ්ටාචාරය තුළ එම භූමිය සුවිශේෂ වාරිමාර්ග සංකීර්ණයකින් ජලාශ්‍රිත වූ නිසා එක ම කුඹුරු යායක් ලෙස දිස් වී ය.

වී ගොවිතැනට අඳ ක්‍රමය, අත්තම් ක්‍රමය, කුලී ගෙවීම මගින් ශ්‍රමය සපයා ගෙන ඇත. වී ගොවිතැනට අමතර ව අබ, මෙනේරි, මුං, තල, මෑ, උක්, කපු, අඹ, පොල්, ආදී වගාවන් ද කර ඇත. හේන් ගොවිතැනට ද විශේෂත්වයක් හිමි විය. වියළි කලාපීය හා අන්තර් කලාපීය ප්‍රදේශ මේ සඳහා යොදා ගැනිණි. ඇල්වී, උඳු, මුං, මෑ ආදී ධාන්‍ය වර්ග ද බටු, ලබු, කැකිරි, පුහුල්, තියඹරා ආදී එළවලු වර්ග ද මේවායේ වගා කරන ලදී.

පේෂ කර්මාන්තය සඳහා අවශ්‍ය වූ කපු ඉතා සාර්ථක ව වගා කළ අතර උක් වගාව ද දියුණුවපැවතිණි.

කෘෂිකාර්මික කටයුතු සඳහා යොදගත් කෙත්වලට අමතර ව කොස්, පොල්, අඹ ආදී ගස් වැවූ වතු දක්නට ලැබිණි, කඳු ප්‍රදේශවල කහ, ඉඟුරු, ගම්මිරිස් වැනි කුළුබඩු හා අල වර්ග වගා කර ඇත.


## කර්මාන්ත

ක්‍රියාකාරකම

**ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ කෘෂිකාර්මික කටයුතු දැක්වෙන රූපික සටහනක් නිර්මාණය කරන්න.**

ජලාශ්‍රිත ශිෂ්ටාචාරය තුළ තිබූ ස්වයංපෝෂිත ආර්ථික රටාව යටතේ ගොවිතැන් කටයුතු හා සම්බන්ධ කර්මාන්ත රැසක් පැවැති බවට සාධක ඇත. වී ගොවිතැන සඳහා භාවිත කළ නගුල, පෝරුව, වියගහ, කැත්ත, දෑකැත්ත, උදැල්ල ආදී උපකරණ පිළිබඳ අට්ඨකථාවල (අටුවා) හා සද්ධර්මරත්නාවලියේ සඳහන් වේ. ඒ නිසා එකල ලෝහ කර්මාන්තය හා වඩු කර්මාන්තය දියුණුව පැවති බව කිව හැකිය. යුද හමුදාවට අවශ්‍ය අවි ආයුධ තැනීම, අලංකාර බුදුපිළිම, දේවරූප හා පහන් නිපදවීම ලෝහ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන වී ය.

කපු නූල් කැටීම, රෙදි විවීම, හා සම්බන්ධ පේෂ කර්මාන්තය ද කුඹල් කර්මාන්තය ආදී කර්මාන්ත ද ඉතා දියුණු මට්ටමක පැවති බව පෙනේ. එමෙන් ම උක් වගාව ආශ්‍රිත ව උක් හකුරු නිපදවීම හා උක්පැණි හිඳින යන්ත්‍ර ගැන සාහිත්‍යයෙන් තොරතුරු ලැබේ.




**සිතියම 4.3 - ප්‍රාදේශීය පාලනය**

ගෘහ නිර්මාණ කටයුතුවල දී ගල් හා ගඩොල් භාවිත කර ඇති නිසා ඒ ආශ්‍රිත කර්මාන්ත ද දියුණුව පැවති බවට සාධක ඇත.

මැණික් ආභරණ සැකසීම තිබූ බැවින් පතල් කර්මාන්තය ද දියුණුව පැවතිණි.

මෙකල විවිධ ශිල්ප ශ්‍රේණි අනුව සංවිධානය වූ කර්මාන්ත තිබූ බවට සාධක හමු වේ. ඉතා උසස් කාර්මික නිර්මාණ රජතුමා විසින් අගය කරන ලද අතර ඒ සඳහා ශිල්පීන්ට තාන්න මාන්න පිරිනැමිණි.

## වෙළෙඳාම

ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ ආර්ථිකයේ අනෙක් වැදගත් සාධකය වූයේ වෙළඳාමයි. මෙය රට අභ්‍යන්තරයේ මෙන් ම විදේශ සමග ද සිදු විය.

ක්‍රියාකාරකම

**ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ කර්මාන්ත පිළිබඳ මූලාශ්‍රයවල සඳහන් තොරතුරු එක්රැස් කර පහත සඳහන් වගු සටහන සම්පූර්ණ කරන්න.**

| කර්මාන්තය | තොරතුරු සඳහන් වන මූලාශ්‍රය | මූලාශ්‍රයේ සඳහන් වන තොරතුරු |
| --- | --- | --- |
| | | |

## දේශීය වෙළඳාම

දේශීය නිෂ්පාදන හා විදේශයන්ගෙන් ආනයනය කළ භාණ්ඩ රට තුළ විවිධ ස්ථානවල වෙළෙඳාම් කිරීමේ ක්‍රමයක් මුල් කාලයේ සිට පැවති බව පෙනේ. මෙය ප්‍රධාන වශයෙන් භාණ්ඩ හුවමාරුව මත සිදු විය. කහවණු නමින් හැඳින් වූ කාසි විශේෂයක් හා මස්ස (මසුරන්) ගැන ද සඳහන් වීමෙන් කාසි භාවිතය ද සිදු වූ බව පෙනේ. රට අභ්‍යන්තරයේ වෙළෙඳපොළ "පදිය" නමින් හැඳින්විණි. මහියංගනය අසල පැවති "හෝපිටිගමුව පදිය" මීට නිදසුනකි. "පදිලද්දන්" යනුවෙන් වෙළෙඳපොළ පාලකයන් හැඳින්වූ බව සඳහන් වේ. වෙළඳ නගර, "නිගම", "නියමතන", "නියම්ගම්" යන නම්වලින් හඳුන්වා ඇත. අභ්‍යන්තර වෙළෙඳාම හා සම්බන්ධ වූ භාණ්ඩ වශයෙන් ලුණු, ඉඟුරු වැනි කුළුබඩු වර්ග, රෙදිපිළි, ආභරණ සුවඳ විලවුන්. විදේශවලින් ගෙන්වූ වටිනා රෙදිපිළි හා පිඟන් භාණ්ඩ ආදිය අයත් වේ. මීට අමතර ව විදේශ වෙළඳාමට අවශ්‍ය ඇතැම් ද්‍රව්‍ය රට තුළින් එකතු කිරීම වෙළෙඳුන් අතින් සිදු විය.

පිටිසරබද ගම්වල කත්වලින් භාණ්ඩ ගෙන ගොස් අලෙවි කරන වෙළෙන්දෝ ද වූහ. දේශීය වෙළඳාම හා සම්බන්ධ ව වෙළෙඳ මණ්ඩල පිහිටුවා තිබූ බව බදුලු සෙල්ලිපියෙන් පැහැදිලි වේ. වෙළෙඳ සංගම් තිබූ බව බඹරගස්තලාව සෙල්ලිපියේ සඳහන් වේ. මේ අනුව සංවිධානය වූ වෙළෙඳ කටයුතු පැවති බව පෙනේ.

වෙළෙඳපොළ සඳහා බදු පැනවීමත් එම ක්‍රියාවලියේ පැවති අයථා ක්‍රියා සොයා බැලීමත්, රජතුමා අතින් සිදු වූ බව බදුලු ටැම් ලිපියෙන් පැහැදිලි ය. ලුණු, මුතු, මැණික් හා ඇතුන් පිළිබඳ වෙළඳ ඒකාධිකාරී බලය ද රජුට හිමි විය.

### විදේශීය වෙළෙඳාම

ප්‍රධාන ගංගා මුහුදට වැටෙන ස්ථානවල පිහිටි තොටුපළ ආශ්‍රයෙන් වෙළෙඳ වරාය දියුණු ව පැවතිණ. ඒවා "පටුන්ගම්" නමින් හැඳින්විණ. මහාතිත්ථ, සූකරතිත්ථ, ජම්බුකෝළතිත්ථ, ගෝකණ්ණතිත්ථ, මෙවැනි පටුන්ගම් කිහිපයකි. මහාතිත්ථ වැනි තොටුපළවලින්, විදේශීය කාසි වර්ග, චීන පිඟන් භාණ්ඩවල කැබලි ආදිය හමු වී ඇති නිසා විදේශීය වෙළඳම දියුණුව පැවති බව පෙනේ. විදේශ වෙළෙඳාම හා සම්බන්ධ ව අපනයන කළ භාණ්ඩ අතර, ඇත් දත්, අලි, ඇතුන්, මුතු, මැණික්, සක් බෙල්ලන්, කැස්බෑ ලෙලි, කපුපිළි ආදිය ප්‍රධාන වේ.

ආනයනය කළ භාණ්ඩ අතර, රන් රිදී, තඹ, ලෝකඩ, වීදුරු, පබළු විවිධ වර්ගවල පිඟන් භාණ්ඩ, උසස් වර්ගයේ රෙදිපිළි හා අශ්වයන් වැදගත් වේ.

ප්‍රධාන වශයෙන් ඉන්දියාව, ග්‍රීසිය, රෝමය, චීනය, අරාබිය, වැනි රටවල් සමග විදේශ සම්බන්ධතා පැවැත්වූ බවට සාධක හමු වේ. මේ අනුව ජලාශ්‍රිත ශිෂ්ටාචාරය ආරම්භයේ පැවැති විදේශ වෙළඳාම පොළොන්නරු යුගයේ දී ඉතාමත් දියුණු විය.

**ක්‍රියාකාරකම**

**"ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ වෙළඳ කටයුතු" යන මාතෘකාව යටතේ ලිපියක් සකස් කරන්න.**

## ආගම හා සංස්කෘතිය

### බුදුදහම

ධර්මාශෝක රජතුමාගේ ධර්මදූත ව්‍යාපාරයේ ප්‍රතිඵලයක් මෙන් ම එතුමා හා දේවානම්පියතිස්ස රජු අතර පැවැති මිත්‍රත්වයේ ප්‍රතිඵලයක් ලෙස මිහිඳු මහ රහතන් වහන්සේ විසින් බුදුදහම ලංකාවට ගෙන එන ලදී. එකල ලංකාව පාලනය කළ තිස්ස රජු බුදු දහම වැළඳ ගැනීම බුදුදහම ව්‍යාප්තියේ ආරම්භය විය. රජ පවුලේ සියලු දෙනා ද අනෙකුත් ප්‍රභූ ජනතාව ද බුදුදහම වැළඳ ගත්හ. ඔවුන් අනුගමනය කළ පොදු ජනතාව ද බුදුදහම වැළඳ ගැනීම බුදුදහම ව්‍යාප්තියට හේතු විය.

මිහිඳු හිමි ඇතුළු පිරිස මිහින්තලයේ සිට අනුරාධපුරය දක්වා වැඩම කරගෙන ඒමත්, උන්වහන්සේලාට මහමෙව්නා උයන පූජා කිරීමත්, පසු ව එහි මහා විහාරය සීමා ලකුණු කිරීමත් සිදු විය. පසු කලෙක මහා විහාරය ථෙරවාදී බුදුදහමේ කේන්ද්‍රස්ථානය බවට පත් විය.

මහජනතාවට වැඳ පුදා ගැනීම සඳහා දේවානම්පියතිස්ස රජතුමා විසින් සර්වඥ ධාතු තැන්පත් කර ථූපාරාම චෛත්‍යය ඉදිකරවීම ලංකාවේ ස්තූප නිර්මාණයේ ප්‍රථම අවස්ථාව ය.

මහාවිහාරයේ හා ථෙරවාදී බුදුදහමේ දීප්තිමත් යුගය වන්නේ දුටුගැමුණු රාජ්‍ය සමයයි. රුවන්වැලි සෑය, මිරිසවැටිය වැනි චෛත්‍ය ඉදිකිරීම සඳහා මෙතුමාගේ අනුග්‍රහය ලැබුණි. එතුමා සංඝයා වහන්සේලගේ ප්‍රයෝජනය සඳහා මහල් නවයකින් යුත් ලෝවාමහාපාය ඉදි කළ බව ද මූලාශ්‍රයවල සඳහන් වේ.

බුදුදහම දියුණු කිරීම මෙන් ම ධර්මය ආරක්ෂා කිරීම සඳහා ද රජවරු පියවර ගත්හ. මුඛ පරම්පරාවෙන් පැවත ආ ත්‍රිපිටක ධර්මය මාතලේ අලුවිහාරයේ දී ග්‍රන්ථාරූඪ කරන ලදී. වළගම්බා රජ සමයේ සිදු වූ මේ කාර්යය සඳහා මූලිකත්වය ගන්නා ලද්දේ එක්තරා ජනපද ප්‍රධානියකු විසිනි. මහානාම රාජ්‍ය සමයේ දී සිහල අට්ටකථා පාලියට පරිවර්තනය කිරීම බුද්ධඝෝෂ හිමියන්ගේ මූලිකත්වයෙන් සිදුවීම ධර්මය ආරක්ෂා කරගැනීමට රාජ්‍ය අනුග්‍රහය ලබා දුන් තවත් අවස්ථාවක් වේ.

**බෞද්ධ මතවාද පිළිබඳ ඓතිහාසික තොරතුරු අධ්‍යයනය කරමු**

වළගම්බා රජතුමා අනුරාධපුරය අතහැර මලය රටට පළා ගොස්, ද්‍රවිඩ ආක්‍රමණිකයන් නෙරපා හැරීමට සේනා සංවිධානය කළේ ය. මෙ කල කුපික්කල තිස්ස මහ තෙරහු රජතුමාට උදව් කළ හ. මෙයට ප්‍රතිඋපකාර වශයෙන් රජතුමා විසින් අභයගිරි විහාරය තනවා උන්වහන්සේට පූජා කරන ලදී. අභයගිරි විහාරය පූජා කිරීම නිසා "කුල සංසග්ගයෙහි" යෙදීමේ හෙවත් ගිහියන් සමග දැඩි සබඳතා පැවැත්වීමේ වරදට මහා විහාරිකයෝ කුපික්කල තිස්ස තෙරුණුවන් මහා විහාරයෙන් නෙරපූහ. ඉන්පසු 500ක් භික්ෂු පිරිස සමග කුපික්කල තිස්ස තෙරණුවෝ අභයගිරියේ වාසයට ගියහ. මෙම සිද්ධිය නිසා සංඝ භේදයක් ඇතිවීමත්, අභයගිරිය වෙන ම භික්ෂු මධ්‍යස්ථානයක් ලෙසට පත්වීමත් නිසා නිකාය භේදයේ ආරම්භය සිදු විය. ජේතවන විහාරය ද ථෙරවාදී අදහස්වලට විරුද්ධ විය.

මේ අතර ඉන්දියාවේ වර්ධනය වෙමින් පැවති මහායාන ධර්මය ලංකාවට පිවිසීමේ ප්‍රවණතාව ද වඩා වර්ධනය වීය. මේ නිසා නිකාය භේදයක් ඇති විය.

වෝහාරික තිස්ස රජතුමාගේ කාලයේ දී වෛතුල්‍යවාදී ධර්මය පිළිබඳ ප්‍රශ්න ඇති වූ බව මහා වංසයේ සඳහන් වේ. ගෝඨාභය රජතුමා වෛතුල්‍යවාදී භික්ෂූන් 60 නමක් දිවයිනෙන් පිටුවහල් කළ බව ද සඳහන් වන නිසා ථෙරවාදී බුදුදහම රැක ගැනීමට රජවරුන් අනුග්‍රහය දක්වා ඇති බව පෙනේ.

මහසෙන් රජ වීමත් සමග නැවතත් වෛතුල්‍යවාදය හිස එසවීම දක්නට ලැබේ. චෝළ දේශයේ සිට මෙරටට පැමිණි සංඝමිත්‍ර භික්ෂුවගේ පෙළඹවීම මත මහසෙන් රජතුමා මහාවිහාරයට එරෙහි විය. මින්පසු ලංකාවේ බොහෝ ප්‍රදේශවල මහායාන අදහස් පැතිරයාමත් විහාර හා ආරාම ඉදිවීමත් දක්නට ලැබේ. බුදුරුවගල ඇති බෝධිසත්ත්ව රූප ආදිය මීට නිදසුන් ය. මහායානික ඇදහීමක් වන අවලෝකිතේශ්වර බෝධි සත්ත්වයන්ගේ ප්‍රතිමා කුෂ්ඨරාජගල හා බුදුරුවගල වැනි ස්ථානවලින් හමු වී ඇත.

මෙසේ රජරට හා අනෙක් ප්‍රදේශවල මහායාන ධර්මය ව්‍යාප්ත වුවත් සමස්තයක් වශයෙන් ගත් විට ථෙරවාදයට ප්‍රමුඛස්ථානය හිමිවීම දක්නට ලැබේ. ලංකාවේ අදට ශේෂ ව පවත්නා බෞද්ධ සාහිත්‍යය මුළුමනින් ම වාගේ ථෙරවාදී බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථවලින් සමන්විත වේ.

පොළොන්නරු යුගයේ දී බුද්ධාගම ව්‍යාප්තියට රාජ්‍ය අනුග්‍රහය ලැබූ බව වංසකථා තොරතුරුවලින් පැහැදිලි වේ. මේ කාලය වන විටත් මහාවිහාරය, අභයගිරිය, ජේතවනාරාමය යනුවෙන් නිකාය මධ්‍යස්ථාන තුනක් බිහි වී තිබිණ. සංඝ සමාජය තුළ පැවති මෙම මතභේද සහගත තත්ත්වය මර්දනය කිරීම සඳහා ශාසන සංශෝධනයක් ඇති කිරීමට මහා පරාක්‍රමබාහු රජතුමා මූලිකත්වය ගත් බව පැහැදිලිය. දිඹුලාගල මහා කාශ්‍යප මහතෙරුන් වහන්සේගේ ප්‍රමුඛත්වයෙන් මහාධිකරණ මණ්ඩලයක් සකස් කළේ ය. මෙහි දී එක් එක් නිකායික භික්ෂූන්ගේ ශීල දුශ්ශීල බව පිළිබඳ විමසන ලදී. මහාවංසයට අනුව අභයගිරි, ජේතවන භික්ෂූන් බොහෝ දෙනා දුශ්ශීලව සිටි බව සඳහන් වේ. දුශ්ශීල භික්ෂූන් වහන්සේලා සිවුරු හරවා රජයේ තනතුරු ලබා දී ඇත. ඇතැම් මහතෙරවරු සාමණේර තත්ත්වයට පත් කරන ලදී. මේ අනුව ක්‍රි.ව. 1165 වර්ෂයේ දී තුන් නිකාය සමගි කළේය. මින් පසු සංඝ සමාජයේ විනයානුකූල පැවැත්ම සඳහා විනය නීති ඇතුළත් පොළොන්නරු කතිකාවත ගල් විහාරයේ පර්වත බිත්තියේ කොටවන ලදී.


ක්‍රියාකාරකම

**ජලාශ්‍රිත ශිෂ්ටාචාරය සමයේ දී බුද්ධාගමේ ව්‍යාප්තියට රාජ අනුග්‍රහය ලැබූ අවස්ථා පිළිබඳ ලැයිස්තුවක් සකස් කරන්න.**

## හින්දු ආගම හා වෙනත් ආගම්

ලංකාවට බුදුදහම හඳුන්වා දීමට පෙර මෙරට පැවති ගස්, ගල් ඇදහීම, ගින්න, වැස්ස, සුළඟ වැනි ස්වභාවික වස්තූන් උදෙසා පුද පූජා පැවැත්වීම, යක්ෂ, නාග ඇදහීම, පැරණි සමාජයේ මෙන් ම අදත් දක්නට ලැබේ.

මිහිඳු හිමියන් ලංකාවට වැඩම කළ කාලයේ ලංකාවේ බ්‍රාහ්මණ ආගම (බ්‍රහ්ම, ඉන්ද්‍ර, සූර්ය යන දෙවිවරු පිදීම) පැවතුන අතර වෛශ්‍රවණ, සුමන වැනි දෙවිවරුන් උදෙසා ද පුද පූජා පැවැත්විණි. මෙම විශ්වාසයන් පවත්වාගෙන යාම බාධාවක් නොවූ නිසා සමහර ජන කොටස් අතර බ්‍රාහ්මණ ආගම හා දෙවිවරු ඇදහීම දක්නට ලැබිණ. පණ්ඩුකාභය, වළගම්බා, මහසෙන් වැනි රජවරුන්ගේ කාලවල දී බ්‍රාහ්මණ ආගම පිළිබඳ තොරතුරු හමුවේ.



රූපය 4.7 - හින්දු ආගමික උත්සවයක්

සංක්‍රමණිකයන් හා ආක්‍රමණිකයන් ලෙස පැමිණි ඉන්දියානුවෝ වෙරළ ආශ්‍රිත තොටුපළවල හින්දු දේවාල ඉදි කළහ. මහසෙන් රජු මෙවැනි කෝවිල් රැසක් විනාශ කළ බව මූලාශ්‍රවල සඳහන් වේ.

අනුරාධපුර යුගයේ අවසානය වන විට කුඩා හින්දු දේවාල කිහිපයක නටබුන් දක්නට ලැබේ. නිදසුන් ලෙස මන්නාරම හා ත්‍රිකුණාමලයේ පිහිටි ශිව දේවාල ක්‍රි.ව. 13වන සියවසේ දී වඩාත් ප්‍රසිද්ධියට පත්වීම දැක්විය හැකි ය. පොළොන්නරුව සොළීන්ට යටත් වීමෙන් පසු පොළොන්නරු නගරයෙහි ශිව දේවාල ඉදිකරවනු ලැබිණි.

පොළොන්නරු යුගයේ සඳකඩපහණින් ගවයා ඉවත් කිරීම හින්දු ධර්මයේ බලපෑම් මත සිදු විය. හින්දු ආගම හා සම්බන්ධ පැරණි ලෝකඩ ප්‍රතිමා හමුවීමෙන් එකල හින්දු ආගම ඇදහූ බව පැහැදිලි වේ. මෙකල ශිව, ගණ දෙවි, විෂ්ණු ආදී දෙවිවරුන්ගේ මෙන් ම පාර්වතී දේවියගේ ප්‍රතිමා ද හමු වේ.

## ජන ජීවිතය

බුදුදහම ජන ජීවිතයට සමීපවීම හේතු කොට ගෙන ජනතාව අතර සාමකාමී සන්සුන් ජීවන රටාවක් ගොඩ නැගිණ. එකල පැවති කෘෂිකාර්මික ආර්ථික රටාව මත ජන ජීවිතය හැඩගැසිණ. බුදු දහමේ ව්‍යාප්තියත් සමග සියලු ජන කොටස් පොදු සමාජයක් ලෙස ගෙන භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යනුවෙන් සලකන ලදී. බුදුන් වහන්සේගේ ඉගැන්වීම් අනුව සාමකාමී සහජීවනයෙන් යුත් සමාජයක් බිහි විය.

අනුරාධපුර යුගයේ පිතෘ මූලික සමාජ ක්‍රමයක් දක්නට ලැබේ. එසේ වුවත් කාන්තාවට ද ස්වෛරී ව කටයුතු කිරීමට නිදහස තිබිණ. පැරණි සමාජයේ ජීවන වෘත්තීන්හි විවිධත්වයක් පැවතුණි. ගොවි, වෙළෙඳ, රන්රිදී වැනි වෘත්තිකයෝ මෙම යුගයේ ජීවත් වූහ. බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍යය, ශුද්‍ර යන වර්ණ පිළිබඳ තොරතුරු සඳහන් වුවත් ඉන්දියාවේ මෙන් උග්‍ර කුල භේදයක් මෙම යුගයේ ලක්දිව නොතිබුණ බව පෙනේ. මෙයට මූලික හේතුව බුදු දහමේ බලපෑමය.

අනුරාධපුර යුගයට වඩා පොළොන්නරු යුගයේ සමාජ ව්‍යුහය තරමක් වෙනස් වී ය. දකුණු ඉන්දීය බලපෑම් නිසා සමාජය වංශ හා කුල කිහිපයකට බෙදී පැවතිණ. ආවාහ විවාහ සිදුවී ඇත්තේ සමාන කුල තරුණ තරුණියන් අතර ය. සමහර අවස්ථාවල වෙනත් කුල අතර ද විවාහ සිදු වී ඇත.

කෘෂිකර්මාන්තය පදනම් කරගත් ජීවන රටාව මෙම යුගයේ ඉතා දියුණු මට්ටමක පැවති බව පෙනේ. පළමුවන පරාක්‍රමබාහු රජුගේ රාජ්‍ය කාලය මෙයට නිදසුනකි. විවිධ වෘත්තීන්හි නිරත වෙමින් ජීවනෝපාය මාර්ග සකස් කරගත් පිරිස් ද මෙකල දක්නට ලැබිණි.

පන්දු කෙළිය, දිය කෙළිය, ඔංචිලි පැදීම වැනි විනෝද ක්‍රීඩා තිබූ බව සාහිත්‍ය කෘතිවල සඳහන් වේ. ගුරු ගෙදර හෝ පිරිවෙන අධ්‍යාපන මධ්‍යස්ථාන විය. පැවිදි සිසුනට මෙන් ම ගිහි සිසුන්ට ද අධ්‍යාපනය ලැබීමට අවස්ථාව ලැබිණ. කාන්තාවන් ද අධ්‍යාපනය ලබා ඇත.

කෘෂිකාර්මික ජීවන රටාව නිසා විවේකීබව වැඩි වූ නිසා ජනතාව සාහිත්‍යය කලා නිර්මාණ ආදියට යොමු විය. මේ අනුව බුදුදහම හා කෘෂිකර්මාන්තය පසුබිම් කොටගත් සංස්කෘතියක් ජලාශ්‍රිත ශිෂ්ටාචාරය ඇසුරින් බිහි විය.

ක්‍රියාකාරකම
**ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ ජන ජීවිතය තුළ කැපී පෙනුණ ලක්ෂණ ලියා දක්වන්න.**

# කලා ශිල්ප හා ගෘහ නිර්මාණ

ශ්‍රී ලංකාවේ කලාශිල්පවල විකාශනය බුදු දහමේ ව්‍යාප්තියත් සමග සිදු විය. මුල් කාලයේ ලෙන්වල හා ආරණ්‍යවල (වනගත ව) වාසය කළ භික්ෂූන් වහන්සේලා සඳහා ආරාම ඉදිකර පූජා කරන ලදී. බෞද්ධ ජනතාවට වන්දනාමාන කිරීම සඳහා චෛත්‍ය හා විහාර ගෙවල් නිර්මාණය වීම, ගෘහ නිර්මාණ ශිල්පයේ දියුණුවට තවත් හේතුවක් විය.

චෛත්‍ය නිර්මාණය ගැන සඳහන් කරන විට ලංකාවේ ඉදි වූ මුල් ම චෛත්‍යය ථූපාරාමයයි. කල් යත් ම රුවන්වැලිසෑය, මිරිසවැටිය, අභයගිරිය, ජේතවනාරාමය ආදී චෛත්‍ය ඉදි විය. චෛත්‍ය ඉදිකිරීමේ දී ශක්තිමත් පාදමක් මත ගොඩනැගීම, ගර්භය ගෝලාකාර ලෙස සකස් කිරීම පැරණි ගෘහ නිර්මාණ ශිල්පීන් තාක්ෂණික උපක්‍රම යොදාගත් අවස්ථා කිහිපයකි.

මේ සඳහා යොදාගත් මිනුම් ක්‍රම ඇතුළත් ගණිත දැනුම ඉතා උසස් මට්ටමක තිබූ බව පෙනේ. චෛත්‍යයේ වාහල්කඩ ඉතා අලංකාර කැටයම් යොදා සකස් කර ඇත.

## වටදාගෙය

චෛත්‍යය වට කර කණු මත පිහිටුවන ලද කවාකාර වහලයකින් යුත් වටදාගෙයකට නිදසුන් ලෙස ථූපාරාමය හා මැදිරිගිරිය දැක්විය හැකි ය. මේ සඳහා ලී කණු හෝ ගල් කණු යොදා ගෙන ඇත. ගල් කණු කැටයම් කොටා අලංකාර කර ඇත.



රූපය 4.8 - අනුරාධපුර යුගයේ සඳකඩපහණ

## ආරාම

බෞද්ධ භික්ෂූන් වහන්සේලා සඳහා ආරාම ඉදි කෙරිණි. අනුරාධපුරයේ පිහිටි මහා විහාර, අභයගිරි විහාර හා ජේතවනාරාම විහාර සංකීර්ණ මීට නිදසුන් ය. දුටුගැමුණු රජතුමා විසින් ලෝවාමහාපාය නව මහල් ප්‍රාසාදයක් ලෙස ඉදිකර භික්ෂූන් දහස් ගණනකට වාසය සඳහා පූජා කළ බව මූලාශ්‍රයවල සඳහන් වේ.

පොහොය ගෙවල්, බෝධිඝර, දානශාලා, භාවනා කුටි හා බෙහෙත් ශාලා ආදිය ද ගෘහ නිර්මාණ ශිල්පයේ වැදගත් නිර්මාණ වී ය.



රූපය 4.9 - පොළොන්නරු යුගයේ සඳකඩපහණ

## කැටයම් හා මූර්ති

කැටයම් හා මූර්ති අතර කොරවක්ගල, සඳකඩපහණ, හා මුරගල ඉතා වැදගත් වේ. සඳකඩපහණ, අඩ සඳක හැඩයට නිර්මණය කළ ගල් කැටයම් පුවරුවකි.

පිපුණු නෙලුම් මලක අඩක් සඳකඩපහණේ මැද දක්වා ඇත. ඒ වටා ලියවැල් රවුමක් ද, හංස පේළියක් ද සිංහ, හස්ති, අශ්ව, වෘෂභ යන සත්ත්වය පෙළක් ද කෙළවර ගිනිදැල් හෝ පළා පෙති මෝස්තර පෙළක් ද ඇතිව එය නිර්මාණය කර ඇත. ගවයා හින්දු භක්තිකයන්ගේ පූජනියත්වයට පත් සතෙකු නිසා පොළොන්නරු යුගයේ දී සඳකඩපහණෙන් ඉවත් කර ඇත.

සඳකඩපහණ දෙපස කැටයම් සහිත මුරගල් හා කොරවක්ගල් දෙකකින් සමන්විත ය.

අශ්ව හිස සහ මිනිසා, ඉසුරුමුණි පෙම් යුවළ ආදී ඉසුරුමුණි විහාරයේ ඇති කැටයම් ද ඉතා උසස් ගණයේ නිර්මාණ වේ.



රූපය 4.10 - කොරවක්ගල



රූපය 4.11 - මුරගල



රූපය 4.12 - ඉසුරුමුණි පෙම් යුවල



**රූපය 4.13 - අශ්ව හිස සහ මිනිසා**




**රූපය 4.14 - සමාධි පිළිමය**

පිළිම නෙළීම කලා ශිල්ප අතර තවත් වැදගත් නිර්මාණයකි, හිඳි පිළිම, හිටි පිළිම හා සැතපෙන පිළිම නිර්මාණය කර ඇත.



**රූපය 4.15 - ගල්විහාර සැතපෙන පිළිමය**



**රූපය 4.16 - අවුකන පිළිමය**

අනුරාධපුර යුගයට අයත් පිළිම අතර බහුල වශයෙන් දක්නට ලැබෙන්නේ හිඳි පිළිම ය. දෙපා හරස්කොට නවා වම්පය මත දකුණු පය ද



**රූපය 4.17 -හින්දු දේව රූපයක් (නටරාජා)**



**රූපය 4.18 - ශිව දේවාල අංක 1**



**රූපය 4.19 - ශිව දේවාලය අංක 2**

උකුලෙහි වම් අත්ල මත දකුණු අත්ල ද තබා ඉතා ලිහිල් ඉරියව්වෙන් සමාධි සුවයෙන් ආසනය මත වැඩ හිඳිනා ආකාරයෙන් බුදු පිළිම නෙළා ඇත. කුට්ටම් පොකුණ අසල ඇති සමාධි පිළිමය මෙයට නිදසුනකි. එක ම අරමුණක් කරා යොමු වී ඇත්තාක් මෙන් නිර්මාණය කර ඇති මෙම පිළිමයෙන් මෛත්‍රිය, කරුණාව වැනි ගුණාංග විදහා දැක්වේ.

හිටි පිළිමයකට නිදසුනක් ලෙස අවුකන පිළිමය සඳහන් කළ හැකිය. බුදුරජාණන් වහන්සේගේ දස බලධාරී ගුණය නිරූපණය වන සේ මෙය නෙළා ඇත. සිවුරේ රැළි නෙළා තිබෙන ආකාරයෙන් එකල සිටි කැටයම් ශිල්පීන්ගේ දක්ෂතාව මනා ව විදහා දැක්වේ.



**රූපය 4.20 - නිශ්ශංක ලතා මණ්ඩපය**

කළුගල් මත ඉතා සියුම් ලෙස නිර්මාණය කර ඇති සැතපෙන පිළිම ද දක්නට ලැබේ. නිදසුනක් ලෙස පොළොන්නරුවේ ගල් විහාරයේ සැතපෙන පිළිමය සඳහන් කළ හැකිය.

සැස්සේරුව (රැස්වෙහෙර), බුදුරුවගල, මාලිගාවිල ආදී ස්ථානවල ඇති බුදු පිළිම ද එකල කලා ශිල්ප ඉතා උසස් මට්ටමක පැවති බවට තවත් නිදසුන්ය.

පොළොන්නරු යුගය වන විට හින්දු ආගම හා සම්බන්ධ දේව ප්‍රතිමා නෙළීම ද දක්නට ලැබේ. ශිව, විෂ්ණු, ගණදෙවි, රූප ඒ අතර වැදගත් වේ. ලෝහ කර්මාන්තයේ විශිෂ්ට නිර්මාණ ලෙස මේවා හැඳින්විය හැකි ය.

හින්දු ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ ව ද තොරතුරු හමු වේ. චෝළ වාස්තු විද්‍යා ශෛලීය අනුව නිමවා ඇති ශිව දේවාල පොළොන්නරුවේ දක්නට ඇත.



**රූපය 4.21**
**සත්මහල් ප්‍රාසාදය**

පොළොන්නරු යුගයේ ඉදිකළ නිශ්ශංක රාජ සභා මණ්ඩපය ඉතා විශිෂ්ට නිර්මාණයකි. රජුගේ සිහසුන ඇත්තේ ගලින් නෙළන ලද සිංහයකු මත ය. නිලධාරීන්ගේ ආසන පනවා තිබූ ස්ථානවල ඇති කණුවල ඔවුන් දරූ තනතුර සඳහන් කොට ඇත. එද රාජ සභාවක ලක්ෂණ මෙයින් හඳුනාගත හැකි ය.

පොළොන්නරුවේ ඇති සත්මහල් ප්‍රාසාදය ගෘහ නිර්මාණ ශිල්පයේ විශේෂිත ගොඩනැගිල්ලකි. මෙහි හැම වහළක ම බිත්තිවල ආරුක්කු සහිත කුහරවල දේවතා රූප දක්නට ඇත. මෙය බොහෝ දුරට ස්තූපයක හැඩයට නිර්මාණය කර ඇත.



**රූපය 4.22 - නෙලුම් පොකුණ**

අනුරාධපුර යුගයේ මෙන් ම පොළොන්නරු යුගයේ වාස්තු විද්‍යාඥයින් නගර නිර්මාණය පිළිබඳ ව ද අවධානය යොමු කර ඇත. මහා වැව්වලින් ජලය සපයා සකස් කළ අලංකාර පොකුණු දක්නට ලැබේ. කුට්ටම් පොකුණ මෙයට නිදසුනකි. පොළොන්නරුවේ නෙලුම් පොකුණ තවත් නිදසුනකි.



**රූපය 4.23 - කුට්ටම් පොකුණ**

කලා ශිල්ප යටතේ චිත්‍ර කලාව ද ඉතා වැදගත් වේ. ලංකාවේ චිත්‍ර අතර සීගිරි චිත්‍ර විශ්ව කීර්තියට පත් වී ඇත. ක්‍රි.ව. 5වන සියවසට අයත් සේ සැලකෙන මෙම චිත්‍ර සීගිරි පර්වත ප්‍රාන්තයේ පිහිටි ලෙන්වල ඇඳ ඇත. නෙළුම්, උපුල් හා සපු ආදී මල් පැලඳ, මල් අතින් ගෙන සිටින ස්ත්‍රීන් දැක්වෙන මෙම චිත්‍ර කාශ්‍යප රජතුමාගේ කාලයේ නිර්මාණය කර ඇත.

පොළොන්නරු යුගයට අයත් චිත්‍ර ලංකාතිලක පිළිමගෙය හා තිවංක පිළිමගෙයි දක්නට ඇත. ලංකාතිලක පිළිමගෙයි බිත්ති මුළුමනින් ම චිත්‍රවලින් සරසා තිබෙන්නට ඇති බව විශ්වාස කෙරේ. දැනට ඉතිරි ව ඇත්තේ එක් දෙරටුවක ආරුක්කුවේ ඇති චිත්‍ර පමණ ය. ගල් විහාරයේ විද්‍යාධර ගුහාවේ ඇති චිත්‍ර ද වැදගත් වේ.

**ක්‍රියාකාරකම**
**ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ ගෘහ නිර්මාණ හා කලාශිල්ප පිළිබඳ පින්තූර හා අදාළ තොරතුරු ඇතුළත් කරමින් පොත් පිංචක් සකස් කරන්න.**

## අධ්‍යාපනය

ජලාශ්‍රිත ශිෂ්ටාචාරය ආශ්‍රිත ව මෙරට බිහි වූ ගිහි පැවිදි පඬිවරුන් හා ලියන ලද ග්‍රන්ථ සංඛ්‍යාව අනුව මෙරට අධ්‍යාපනය උසස් මට්ටමක පැවති බව පෙනේ. දරුවකුගේ අධ්‍යාපන කටයුතු සඳහා ගුරු ගෙදරට හෝ විද්‍යා ස්ථානයකට යැවීම සිදු විය. විද්‍යා ස්ථාන වශයෙන් පන්සල හා පිරිවෙන වැනි ආයතන බිහි විය. පැවිදි සිසුන්ට මෙන් ම ගිහි සිසුන්ට ද අධ්‍යාපනය ලැබීමට අවස්ථාව හිමි විය. ඉගැන්වීම් ක්‍රමය වූයේ ගුරුවරයා කියන දේ අසා ඉගෙනීම හෝ වනපොත් කරවීමයි. ප්‍රථමයෙන් වැලිපිල්ලක අකුරු ලියා පසු ව පුස්කොළවල පන්හිඳෙන් ලියා ඇත. මෙකල විෂය මාලාවට අයිති වූ විෂය රාශියකි. ගණිත, තර්ක, ව්‍යාකරණ, ඡන්දස්, මන්ත්‍ර, නක්ෂත්‍ර, ධනු ශිල්ප, හස්ති ශිල්ප, ආදිය ඉන් සමහරකි. ඉගැන්වීමේ භාෂා වශයෙන් පාලි, සංස්කෘත හා සිංහල භාෂා භාවිතයේ පැවති බවට සාධක ඇත.

## භාෂාව හා සාහිත්‍යය

පාලි සාහිත්‍යය, සංස්කෘත සාහිත්‍ය හා සිංහල සාහිත්‍යය මෙහි දී වැදගත් වේ. සිංහල භාෂාවේ මූල භාෂා දෙකක් වශයෙන් පාලි හා සංස්කෘත භාෂාවන් හැදෑරීම උගතුන් අතර ප්‍රචලිත විය.

## පාලි සාහිත්‍යය

බුද්ධඝෝෂ හිමියන් විසින් හෙළ බසින් රචිත අටුවා ග්‍රන්ථ පාලි භාෂාවට පරිවර්තනය කරන ලදී. උන් වහන්සේ හා තවත් උගතුන් විසින් සම්පාදිත අට්ඨකථා සාහිත්‍යය ද මෙහි දී වැදගත් ය. බුද්ධඝෝෂ හිමියන් විසින් විවිධ කෘති ද පාලි භාෂාවෙන් රචනා කර ඇත. මෙය අට්ඨකථා හා ත්‍රිපිටකය සම්පූර්ණයෙන් ම හදරා බුද්ධ ධර්මය කැටි කොට දැක්වීමකි.

බුද්ධඝෝෂ හිමියන් විසින් සම්පාදනය කරන ලද සමන්තපාසාදිකා, පපඤ්චසූදනී, සම්මෝහවිනෝදනී, මනෝරථපූරණී යන ග්‍රන්ථ ඒ අතර වැදගත් වේ. දීපවංශය හා මහාවංසය ද පාලි සාහිත්‍යයට ඇතුළත් වේ. විනය සංග්‍රහය, සාරාර්ථදීපනී, මොග්ගල්ලාන ව්‍යාකරණය ආදී ග්‍රන්ථ පොළොන්නරු යුගයේ රචිත පාලි ග්‍රන්ථ වේ.

## සංස්කෘත සාහිත්‍යය

සාරාර්ථසංග්‍රහය, ජානකීහරණය වැනි ග්‍රන්ථ මීට අයත් වේ. ක්‍රි.ව. 7වන සියවස පමණ වන විට පෙරදිග රටවල ජාත්‍යන්තර භාෂාව ලෙස භාවිත වූ භාෂාව වූයේ සකු බස යි.

## සිංහල සාහිත්‍යය

බුදුදහම ලංකාවට ගෙන ඒමෙන් පසු එය සිංහලයාට, වටහා ගැනීම පහසු වීම සඳහා “හෙළටුවා” නමින් ග්‍රන්ථ මාලාවක් සැකසී ඇත. මහා අටුවා, මහා පච්චරී අටුවා, කුරුන්දි අටුවා යන මෙම ග්‍රන්ථ සිංහල සාහිත්‍යයේ වැදගත් කෘතීන් ය. මෙම කෘති අද දක්නට නො ලැබේ.

පස්වන කාශ්‍යප රජතුමා විසින් ලියන ලදැයි සැලකෙන දම්පියා අටුවා ගැටපදය, ධම්ම පදට්ඨ කථාවේ ගැඹුරු වදන් සිංහලෙන් විවරණය කරන ග්‍රන්ථයකි. සිඛ වළඳ හා සිඛවළඳ විනිස හෙළ බසින් ලියවුණු තවත් කෘති දෙකකි. සිව්වන සේන රජු විසින් ලියන ලද සියබස්ලකර ද තවත් වැදගත් ග්‍රන්ථයකි. බැබිරිය, කසුප්තොට ඇපා, ආදී වශයෙන් මහා කවීන් 12 දෙනෙකු පළමුවැනි අග්බෝ රජු දවස සිටි බව නිකාය සංග්‍රහයේ සඳහන් වීමෙන් මෙම යුගයේ දියුණු සාහිත්‍යයක් පැවති බව නිගමනය කළ හැකි ය. පොළොන්නරු යුගයේ රචිත සසඳාවත, මුවදෙව්දාවත, අමාවතුර, බුත්සරණ, සිංහල ථූපවංශය ආදිය සිංහල සාහිත්‍යයට අයත් වේ.

පොළොන්නරු යුගයේ ජනප්‍රිය වූ ගද්‍ය සාහිත්‍ය අංගයක් වූයේ සන්න ලිවීමයි.

අභිධම්මත්ථ සංග්‍රහ සන්නය, මේඝදූත සන්නය, ජනාකීහරණ සන්නය, සසඳා සන්නය, මින් කිහිපයකි. මේ යුගයේ ගැටපද පොත් ලිවීම ද බහුල ව සිදුවිය. මහා බෝධි වංශ ගැටපදය, ජාතක අටුවා ගැටපදය ඉන් කිහිපයකි.

**ක්‍රියාකාරකම**

**ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ භාෂාව හා සාහිත්‍යය දියුණුව පැවති බවට නිදසුන් ඉදිරිපත් කරන්න.**

## විදේශ සම්බන්ධතා

ලංකාව සමග විදේශ සම්බන්ධතා ඇතිවීමට මෙරට ස්ථානගත පිහිටීම බලපා ඇත. මෙහි දී පහත සඳහන් කරුණු වැදගත් වේ.

- ✦ පෙර අපර දෙදිග වෙළඳ මාර්ගයේ (මුහුදු සේද මාවතේ) කේන්ද්‍රස්ථානයක ලංකාව පිහිටා තිබීම
- ✦ නිරිතදිග හා ඊසානදිග මෝසම් සුළඟ ආශ්‍රිත ව ඇති දියවැල්වල පිහිටීම
- ✦ ඉන්දියාවට ආසන්නව එහෙත් ඉන්දියාවෙන් වෙන්ව පිහිටීම
- ✦ දිවයින වටා ස්වභාවික වරායන් පිහිටීම
- ✦ මෙවැනි සාධකවල බලපෑම් නිසා ලංකාව සමග විදේශ රටවල් විවිධ ආකාරයේ සම්බන්ධතා පවත්වා ඇත. මෙහි දක්වා ඇති රූපික සටහන අධ්‍යයනය කර එවැනි සම්බන්ධතා කිහිපයක් හඳුනා ගනිමු

**රූපික සටහන**

**විදේශ සම්බන්ධතා**

| | | |
|---|---|---|
| රාජ්‍ය තාන්ත්‍රික | සංක්‍රමණ | විජයකුමරු ඇතුළු පිරිස ලංකාවට පැමිණීම<br>පඬුවස්දෙව් ඇතුළු පිරිස ලංකාවට පැමිණීම<br>සංඝමිත්තා තෙරණින් ඇතුළු පිරිස ලංකාවට පැමිණීම |
| | ආක්‍රමණ | වළගම්බා රජු කල පැමිණි පුලහත්ථ ඇතුළු හත්දෙනාගෙන් පස්දෙනෙකු විසින් සිංහාසනය පැහැර ගැනීම<br>මිත්සෙන් රජ දවස පැමිණි පණ්ඩු හා පාරින්ද ඇතුළු කණ්ඩායම |
| | විවාහ | විජය රජ මදුරාපුරයෙන් බිසවක් ගෙන්වා ගැනීම<br>පඬුවස් දෙව් රජ දවස භද්දකච්චානා කුමරිය පැමිණීම<br>හතර වන මිහිඳු කාලිංග කුමාරියක් සමග විවාහ වීම |
| | මිත්‍ර සම්බන්ධතා | අශෝක රජු හා දේවානම්පියතිස්ස අතර සම්බන්ධතා<br>රෝමයේ ක්ලෝඩියස් රජුගේ කාලයේ දී ගෙනන ලද පබළුවලින් රුවන්වැලි මහා සෑය අලංකාර කිරීම |
| | රාජ්‍යත්වය සඳහා සහාය | අභයනාග රජු දකුණු ඉන්දියානු පාලකයන්ගෙන් උදව් ලබාගැනීම<br>සිරිනාග රජු දකුණු ඉන්දියානු පාලකයන්ගෙන් සහාය පැතීම<br>තෙවන අග්බෝ දකුණු ඉන්දියානු පාලකයන්ගෙන් සහාය පැතීම |
| | සිරකරුවන් | පළමුවෙනි පරාක්‍රමබාහු රජු පාණ්ඩ්‍ය දේශයේ සිංහාසනය සඳහා වූ අරගලයේ දී පාණ්ඩ්‍ය කුමාරයකුට සහාය ලබා දීම |
| සංස්කෘතික / ආගමික / ගෘහ නිර්මාණ | බෞද්ධ | ක්‍රි.පූ. 247 දී මෙරටට බුදුසසුන හඳුන්වාදීම, මෙහෙණිසස්න පිහිටුවීම<br>ඉන්දීය බෞද්ධ මධ්‍යස්ථාන සමග සම්බන්ධතා පැවැත්වීම |
| | හින්දු | පොළොන්නරුවේ ශිව දේවාල<br>ශිව, විෂ්ණු, ගණදෙවි රූප සොයාගෙන තිබීම |
| | ඉස්ලාම් | අරාබිය සමග සම්බන්ධතාවල ප්‍රතිඵලයක් ලෙස ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ඉස්ලාම් භක්තිකයන් පදිංචි වීම |
| | මූර්ති | ගුප්ත අභාසය - සමාධි පිළිමය |
| | කැටයම් | ද. ඉන්දියානු අමරාවතී කැටයම් - අවුකන පිළිමය |
| | චිත්‍ර | ගුප්ත යුගයේ අජන්තා චිත්‍ර - ලංකාවේ සීගිරි චිත්‍ර |
| | අක්ෂර | බ්‍රාහ්මීය අක්ෂර - සිංහල හෝඩිය |

**ක්‍රියාකාරකම්**

**මූලාශ්‍රය තොරතුරු අධ්‍යයනය කරමින් ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ ශ්‍රී ලංකාව සමග විවිධ අංශ යටතේ පැවැත්වූ විදේශ සම්බන්ධතා පිළිබඳ ලේඛනයක් සකස් කරන්න. (ඉහත රූපික සටහනේ සඳහන් තොරතුරුවලට අමතර තොරතුරු සොයන්න).**

## ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ පරිහානිය

ක්‍රි.පූ. 6වන සියවසේ සිට ක්‍රි.ව. 13වන සියවස ආරම්භය දක්වා ලංකාවේ පැවති ජලාශ්‍රිත ශිෂ්ටාචාරය ක්‍රි.ව. 1215 මාඝයේ ආක්‍රමණයෙන් පසු පරිහානියට පත් විය. අනුරාධපුර හා පොළොන්නරු යන ප්‍රදේශවල තිබූ වෙහෙර විහාර, වාරිමාර්ග විනාශ විය. වාරි කර්මාන්ත ප්‍රතිසංස්කරණය නොකළ නිසා ඒවායින් ජලය ලබාගත් කුඹුරු පුරන් විය. වියළි කලාපීය ප්‍රදේශ වනාන්තර බවට පත් වී ය. වාරි සැලැස්ම පවත්වාගෙන යාමට පසුකාලීන පොළොන්නරු පාලකයෝ අපොහොසත් වූ හ.

මාඝයේ ආක්‍රමණයෙන් පසු රජරට ප්‍රදේශ ඔහුට යටත් වූ නිසා ජනයා එම ප්‍රදේශ අතහැර මලය රටටත්, දකුණු ප්‍රදේශයටත්, සංක්‍රමණය වූහ. භික්ෂූන් වහන්සේලාගෙන් කොටසක් විදෙස්ගත වූහ. මේ නිසා රජරට ප්‍රදේශයේ ආර්ථික පරිහානියක් සිදු විය. වනාන්තර බිහිවීම නිසා මැලේරියා වසංගතය වැනි රෝග පැතිර ගියේ ය.

මේ අනුව පොළොන්නරු යුගය අවසාන භාගයේ සිහසුන පිළිබඳ ඇති වූ ගැටුම් ද රටේ මධ්‍ය පාලනය දුර්වල වීමට බලපාන ලදී. මෙවැනි හේතු නිසා ජලාශ්‍රිත ශිෂ්ටාචාරය පරිහානියට පත්විය.

## ක්‍රියාකාරකම

**ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ පරිහානියට බලපෑ ප්‍රබලතම හේතුව වන මාඝගේ ආක්‍රමණය පිළිබඳ තොරතුරු දැන ගැනීම සඳහා මහාවංසය අධ්‍යයනය කරන්න.**

## සාරාංශය

- වාරිකර්මාන්තය ආශ්‍රිත ව උසස් තාක්ෂණික ක්‍රම භාවිත කර තිබීම
- වාරි කර්මාන්තය දියුණු කිරීම සඳහා රාජ අනුග්‍රහය නොමඳ ව ලැබීම
- රජු පාලනයේ ප්‍රධානියා වූ අතර පාලන සංවිධානය විධිමත් ව පැවතීම
- ප්‍රාදේශීය පාලනය හා ග්‍රාම පාලනය තිබූ නිසා පරිපාලන ව්‍යුහය විධිමත් ව සකස් වී තිබීම
- ආර්ථික රටාවේ දී කෘෂිකර්මය, කර්මාන්ත හා වෙළඳාම වැදගත් වීම
- මෙකල බුද්ධාගම ප්‍රධාන ආගම වූ අතර හින්දු ආගමට ද වැදගත් ස්ථානයක් හිමි වීම
- අනුරාධපුර යුගයේ දී මහායාන අදහස් නිසා බෞද්ධ මතවාද වර්ධනය වීම
- මෙකල පීතෘ මූලික ජන සමාජයක් දක්නට ලැබීම
- පන්දු කෙළිය, දියකෙළිය, ඔංචිලි පැදීම වැනි විනෝද ක්‍රීඩා තිබීම
- ගෘහ නිර්මාණ, කැටයම් කලාව, චිත්‍ර හා මූර්ති ද දියුණුව පැවතීම
- පිරිවෙන් මුල්කරගත් අධ්‍යාපනික පසුබිමක් තිබීම
- සිංහල පාලි හා සංස්කෘත සාහිත්‍යය දියුණුව පැවතීම
- මෙකල රාජ්‍ය තාන්ත්‍රික හා සංස්කෘතික යන අංශ යටතේ විදේශ සමග සම්බන්ධතා පැවතීම
- විදේශ සම්බන්ධතා ඇතිවීමට ලංකාවේ පිහිටීම වැදගත් වීම
- කාලිංග මාඝගේ ආක්‍රමණය, දුර්වල පාලකයන් බලයට පත්වීම ආදී හේතු නිසා ජලාශ්‍රිත ශිෂ්ටාචාරය පරිහානියට පත් වීම

## අභ්‍යාස

1. පැරණි වැවක රූප සටහනක් ඇඳ එහි අංග නම් කරන්න.
2. වාරි කර්මාන්තය සඳහා අනුග්‍රහය දැක්වූ රජවරුන් දෙදෙනෙක් නම්කර ඔවුන්ගෙන් සිදු වූ සේවාවන් 3 බැගින් ලියන්න.
3. ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ මධ්‍ය පාලනයේත්, ප්‍රාදේශීය පාලනයේත්, ගම් පාලනයේත්, ඉස්මතු ව පෙනෙන ලක්ෂණ 3 බැගින් ලියන්න.
4. එකල දියුණුව පැවති කර්මාන්ත නම් කරන්න.
5. ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ ස්වයංපෝෂිත අර්ථ ක්‍රමයක් දක්නට ලැබුණ බවට නිදසුන් 2 ක් ලියන්න.
6. විදේශ වෙළෙඳාම යටතේ වගු සටහනක් සකස් කරන්න.
7. රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා පැවැත්වූ අවස්ථා හා සංස්කෘතික සම්බන්ධතා පැවැත් වූ අවස්ථා පිළිබඳ ලේඛනයක් සකස් කරන්න.
8. ජලාශ්‍රිත ශිෂ්ටචාරය අළලා ලියවුණු පාලි සංස්කෘත හා සිංහල ග්‍රන්ථ නාමාවලියක් සකස් කරන්න.
9. ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ පරිහානියට බලපෑ හේතු දක්වන්න.

## වැඩිදුර කියවීමට පොත්

- ලංකා ඉතිහාසය 1 කොටස - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
- ලංකා ඉතිහාසය 2 කොටස - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
- ලංකා ඉතිහාසය - ලංකා විශ්වවිද්‍යාලය 1 කොටස
- සංක්ෂිප්ත ලංකා ඉතිහාසය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරය - මහාචාර්ය එච්.ටී. බස්නායක.